ජනවාරි
2024

# වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය 2024

2024 සහ ඉදිරිය සඳහා මුදල්
සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# 2024 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති ප්‍රකාශය

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ** | *ශ්‍රී ලංකා මහ බැංකු අධිපති*

**2024 ජනවාරි 10**

***සාරාංශය***

*පසුගිය වසර කිහිපය තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකයට සහ එහි ජනතාවට මුහුණ දීමට සිදු වූ අභියෝග නිදහසින් පසු ඉතිහාසයේ අත් විඳීමට සිදු වූ වඩාත් ම දුෂ්කර අභියෝග විය. කිසියම් දුරකට සැලකිය යුතු මට්ටමේ සමාජ-ආර්ථික පිරිවැයක් නිර්මාණය කරමින් වුවද, මේ දක්වා ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් ස්ථායීතාව නැවත තහවුරු කිරීම සඳහා සහාය සැලසී ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ කෙටි කාලීන සහ මැදි කාලීන යථා තත්ත්වයට පත්වීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් විස්තීරණ අරමුදල් පහසුකම යටතේ ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ මාලාව සාර්ථකව අඛණ්ඩව ක්‍රියාවට නැංවීම මත රඳා පවතී. මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කරන අතර ම, රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ බාහිර අංශයේ ස්වාරක්ෂක ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන විශ්වසනීය පියවර මෙයට ඇතුළත් වේ. තවද, ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම සහතික කිරීම සඳහා යහ පාලනය වැඩි දියුණු කිරීම මෙන්ම, සමාජ සුබසාධනය සඳහා සහාය සැලසීම ද ඉතා වැදගත් වේ. ආර්ථික අර්බුදයෙන් පසුව දක්නට ලැබුණු සෘණාත්මක බලපෑම් යහපත් අතට පරිවර්තනය කරගැනීම සඳහා ඉවහල් වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙහිලා ශ්‍රී ලංකාව කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. මිල ස්ථායීතාව නැවත ස්ථාපිත කිරීම, විදේශ ස්වාරක්ෂක නැවත ගොඩනැගීම, මූල්‍ය පද්ධති ස්ථාවරත්වය සහතික කිරීම, රාජ්‍ය ආදායම් වැඩි දියුණු කිරීම හා ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම, දරිද්‍රතාවෙන් පෙළෙන හා අවදානමට ලක්වූ කාණ්ඩවලට සහාය සැලසීම මෙන්ම, යහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග යනාදිය මේ දක්වා සාක්ෂාත් කරගෙන ඇති කැපී පෙනෙන ජයග්‍රහණ වේ. ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි තහවුරු කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම පිළිබඳව නැවත නැවතත් ගෝලීය බහුපාර්ශ්වික ආයතන වෙත අවධාරණය කිරීම තුළින් මෙම ජයග්‍රහණ ලබා ගැනීමට හැකි විය. එහෙයින්, දැනට කරගෙන යනු ලබන ප්‍රතිසංස්කරණ ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අප්‍රතිහත කැපවීම මත ජාත්‍යන්තර ප්‍රජාවේ විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීම රඳා පවතී. මෙම පසුබිම යටතේ, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි, කම්පනවලට ඔරොත්තු දිය හැකි අන්දමේ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා සහාය සලසමින්, දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම හා පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන අරමුණු ඉටුකරගැනීම සඳහා වන සිය කැපවීම හරහා වඩාත් හිතකර සාර්ව ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.*

## 1. 2023 වසරේ ආර්ථික කාර්යසාධනය

**2023 වසරේ අග භාගයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කිරීමට පටන් ගත්තේය.** 2022 වසරේ පළමු කාර්තුවේ සිට අඛණ්ඩව ආර්ථිකයේ සංකෝචනය වීම් වාර්තා වීමෙන් අනතුරුව, 2023 වසරේ තුන්වන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා කළේය. 2023 වසරේ අවසාන කාර්තුව තුළ ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් අඛණ්ඩව වර්ධනය වීමක් ඉදිරි ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරේ.

**2022 දී පෙර නොවූ විරූ මට්ටම් කරා ඉහළ ගිය උද්ධමනය වසරක කාලයක් තුළ තනි ඉලක්කමක මට්ටමට ගෙන ඒමට හැකිවිය.** උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අගය වාර්තා කළ ද, මිල ඉහළ යෑම ඉක්මනින් පාලනය කෙරුණු අතර, ඉන් අනතුරුව සාධනීය නිරුද්ධමන මාවතකට ප්‍රවේශ වී අවසානයේ දී වසරක කාලයක් තුළ ඉලක්කගත මට්ටම් දක්වා උද්ධමනය පහළට ගෙන ඒමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාවේ ශීඝ්‍ර නිරුද්ධමන ක්‍රියාවලියට මහ බැංකුව සහ රජය යන දෙඅංශයෙන්ම ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් මගින් සහාය සැලසුණි. මේ අතර, ආර්ථිකයේ යටි දැරි ඉල්ලුම් පීඩනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ද 2023 වසර තුළ දී ස්ථාවර අන්දමේ නිරුද්ධමනයක් වාර්තා කළේය.

**උද්ධමන අපේක්ෂාවන් ඉලක්කගත මට්ටම් ආසන්නයේ පාලනය කර ගැනීමට හැකිව ඇත.** කෙටි කාලීන ව වේදනාකාරී බලපෑම් ඇති කළ ද, ආර්ථිකයේ ස්ථාවරත්වය සහ විශ්වාසය යළි ස්ථාපිත කිරීම අරමුණු කරගත් පුළුල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2022 වසර තුළ දී පාලනයෙන් බැහැරව පැවති උද්ධමන අපේක්ෂා ස්ථාවර කිරීම සඳහා උපකාරී විය.

**උද්ධමනය ස්ථාවර ලෙස පහළ යෑම සහ උද්ධමන අපේක්ෂා ඉලක්කගත පරාසය තුළ මනාව පාලනය වී තිබීම හේතුවෙන් 2023 මැද භාගයේ දී සිය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය.** උද්ධමනය පහළ යෑම, හිතකර උද්ධමන අපේක්ෂා, ස්ථාවර උද්ධමන ඉදිරි දැක්ම සහ විදේශ අංශයේ දක්නට ලද වැඩිදියුණුවීම් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2023 ජූනි මාසයේ දී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම ආරම්භ කළේය. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග සහ පරිපාලන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන් ම තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය. වෙළෙඳපොළ ණය පොලී අනුපාතික ද, ඉහළ අවදානම් අධිමිල මධ්‍යයේ රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ප්‍රමාණාත්මක ලෙස පහළ යෑමට පවතින ප්‍රමාදය කිසියම් දුරකට හේතුකොටගෙන, මන්දගාමී වේගයකින් පහළ ගියේය.

**ශ්‍රී ලංකා මහ බැංකු නීති පනත බලාත්මක කිරීම මගින්, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව, ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ වඩාත් පැහැදිලි බවක් සහ වැඩිදියුණු වූ මහජන වගවීම සමඟින් මහ බැංකුවට ස්වාධීනත්වය ලබා දී ඇත.** මහ බැංකු නීති පනත බලාත්මක කිරීමත් සමඟ, ආර්ථිකයට එහි විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට සහාය වෙමින් මැදි කාලීනව නියමිත ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වා ගැනීම අරමුණු කරගත් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් පිළිගැනුණු අතර, නම්‍යශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තිය ද ඊට අනුපූරක ප්‍රතිපත්තියක් ලෙස පිළි ගැනේ. මහ බැංකු පනත මගින් මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩිදියුණු වන අතර ම, එහි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මහ බැංකුවේ වගවීම ද වැඩිදියුණු වී ඇත. නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි අවශ්‍යතාවය පරිදි, සියයට ±2ක පරාසයකට යටත්ව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමනය සියයට 5ක් ලෙස පවත්වා ගැනීම සඳහා මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කරන ලදී. අඛණ්ඩව කාර්තු දෙකකට වඩා වැඩි කාලයක් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත්

වුවහොත්, එම අපගමනය සඳහා හේතු, අනුගමනය කර ඇති විසඳුම් ක්‍රියාමාර්ග සහ අදාළ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාලය පිළිබඳව විස්තර කෙරෙන වාර්තාවක් මහ බැංකුව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාව මහජනතාවට ද ලැබෙන පරිදි ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. මහ බැංකු නීති පනත තුළ මූලික වශයෙන් මහ බැංකුවෙන් රජය වෙත සැපයෙන මූල්‍යන පහසුකම් සම්බන්ධයෙන් පනවා ඇති සීමා සහ තීරණ ගැනීමේ මණ්ඩලවල රජයේ නියෝජනය ඉවත් කිරීම හරහා මහ බැංකුවට ස්වාධීනත්වය හිමි වේ. තවද, පාලක මණ්ඩලයට අමතරව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය නමින් වෙනම තීරණ ගැනීමේ මණ්ඩලයක් නිර්මාණය කිරීම මගින්, නව නීති සම්පාදනය හරහා දේශීය වශයෙන් මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා ස්වාධීන මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. ඒ අනුව, එවැනි පැහැදිලි නෛතික සහ ආයතනික රාමු ස්ථාපිත කිරීම මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය මෙන්ම මහ බැංකුවේ සමස්ත පාලනය ද ශක්තිමත් කරයි.

**ඉහළ ගිය විදේශ විනිමය ලැබීම්වල සහාය හමුවේ, 2023 වසරේ දී බොහෝදුරට යථා තත්ත්වයට පත් වූ ස්ථාවරත්වය සමඟින් විදේශීය අංශය සිය අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය.** මෙමගින් ගෙවුම් ශේෂය වඩාත් ශක්තිමත් වූ අතර, ජාත්‍යන්තර සංචිතවල ස්වභාවික වර්ධනය සඳහා සහාය සලසමින් ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ඉතා අඩු මට්ටමක් දක්වා පහළ වැටුණු දළ නිල සංචිත 2023 වසර අවසන් වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 4.4ක් දක්වා වර්ධනය විය. මෙලෙස දළ නිල සංචිතවල ශීඝ්‍ර වර්ධනය සඳහා, මහ බැංකුව විසින් සැලකිය යුතු ප්‍රමාණයකින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ ලද වාරික දෙක සහ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් රජයට තවදුරටත් ලබා දුන් මූල්‍ය ආධාර මූලික වශයෙන් හේතු විය. සීමිත ආනයන ක්‍රියාකාරකම් හේතුවෙන් නිර්මාණය වූ සාපේක්ෂව අඩු වෙළඳ හිඟය මධ්‍යයේ, සේවක ප්‍රේෂණ සැලකිය යුතු ලෙස වර්ධනය වීම, සංචාරක ඉපැයීම් ශීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත්වීම සහ සේවා ගිණුමට ලද ලැබීම්වල බලපෑම පිළිබිඹු කරමින්, විදේශීය ජංගම ගිණුම 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. නම්‍යශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුපූරක වන බව මහ බැංකු පනත මගින් පිළිගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ දී වාර්තා වූ සැලකියයුතු අවප්‍රමාණය වීමෙන් අනතුරුව, 2023 වසරේ දී රුපියලෙහි අගය ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකා රුපියල වඩාත් ස්ථාවරත්වයක් පෙන්නුම් කර ඇත.

**අඛණ්ඩව පැවති රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා, 2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදය සඳහා ප්‍රධානතම හේතුව වශයෙන් හඳුනාගනිමින්, රාජ්‍ය මූල්‍ය අංශයේ තිරසරභාවය යළි ස්ථාපිත කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමට සමගාමීව ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවතකට රජය අවතීර්ණ විය.** බදු ආදායම් එකතු කිරීමේ ඇති වූ කැපී පෙනෙන වර්ධනයක් සමඟ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල බලපෑම 2023 වසරේ රාජ්‍ය මූල්‍ය ගිණුම්වල පිළිබිඹු වීම ආරම්භව ඇත. අයවැය හිඟය 2023 වසර තුළ සහ ඉන් ඉදිරියට අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම රජය සතු ව්‍යවසායයන්හි මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීමට උපකාරී වී ඇත. රාජ්‍ය ණයෙහි ගමන් මාවත තිරසාර මට්ටමකට ගෙන ඒම සඳහා වන ප්‍රයත්නයේ අංගයක් ලෙස රජය විසින් දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සාර්ථකව නිම කරන ලදී. තවද, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීනයේ එක්සිම් බැංකුව සමඟ ප්‍රතිපත්තිමය එකඟතාවකට එළඹ ඇති අතර, අනෙකුත් ණය හිමියන් සමඟ ඉතා ඉක්මනින් ප්‍රතිපත්තිමය එකඟතාවන් වෙත ළඟා වීම සඳහා යහ අරමුණින් පවත්වන සාකච්ඡා අඛණ්ඩව සිදුවෙමින් පවතී.

**අහිතකර සාර්ව-මූල්‍ය ප්‍රවණතා මගින් පැන නැඟි අස්ථාවරතා හේතුවෙන් මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ ඉදිරියට ගමන් කළේය.** මෙම තත්ත්ව හේතුවෙන්,

මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සහ ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුවට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් ගැනීමට සිදු විය. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන හා සමගාමීව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මාලාවක් ද හඳුන්වා දෙන ලදී. මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා මහ බැංකුවේ ඇති කැපවීම යළි යළිත් අවධාරණය කරමින්, අර්බුදකාරී අවස්ථා සඳහා පෙර සූදානම සහ කළමනාකරණ රාමු ශක්තිමත් කිරීම ඇතුළු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදු කරමින් මහ බැංකුව විසින් කැළඹිලි සහිත කාල පරිච්ඡේදයක් තුළ මූල්‍ය පද්ධතිය ප්‍රවේශමෙන් මෙහෙයවන ලදී. මහ බැංකු පනත මගින් මහ බැංකුව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස පිළිගන්නා ලද අතර, ඒ සඳහා අවශ්‍ය බලගැන්වීම් සපයයි.

**ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය පාලනය කරන නීතිමය රාමුව ශක්තිමත් කිරීමට මහ බැංකුව පියවර ගන්නා ලදී.** 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය සහ නිරාකරණය කිරීමේ බලතල අර්ථ දැක්වීමේ අරමුණින් හඳුන්වා දුන් තවත් වැදගත් නීති සම්පාදනයකි. මෙම පනත මගින් මූල්‍ය ආරක්ෂණ ජාල යාන්ත්‍රණ සහ රජය සමඟ සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීමට නියමිත නව නිරාකරණය කිරීමේ ක්‍රමවේද හඳුන්වා දෙන ලදී. මෙම පනත මගින් මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට ද පහසුකම් සලසා ඇත. තවද, මෙම පනත මගින් තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට ව්‍යවස්ථාපිත පිළිගැනීමක් ලබා දෙන අතර ම, බලපත්‍රලාභී බැංකු ක්‍රමානුකූලව ඈවර කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් සැකසීම ද සිදු කරයි. බලපත්‍රලාභී බැංකුවලට අදාළ වන නිරාකරණය කිරීමේ ක්‍රමවේද බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අවශ්‍යතාවය පරිදි අනුගමනය කිරීම සඳහා අවස්ථාව ද බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ සලසා දී ඇත. ලෝක බැංකුව විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (International Development Association) හරහා ක්‍රියාත්මක කළ සහනදායී ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණ යාන්ත්‍රණය හා සම්බන්ධ වෙමින්, මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය හා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීමටත් පියවර ගන්නා ලදී. තවද, මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා අතිරේක අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමෝපායක් ස්ථාපිත කිරීමට ද පියවර ගෙන ඇත. 1988 අංක 30 දරන බැංකු පනතට අදාළ විධිවිධාන තවදුරටත් ශක්තිමත් හා විධිමත් කිරීම මෙන්ම, එම විධිවිධාන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මහ බැංකුව දැනට පවතින බැංකු පනත සංශෝධනය කිරීමේ නිරතව සිටියි. මහ බැංකුව 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සහ 2000 අංක 56 දරන කල්බදු සමාගම් පනත සංශෝධනය කිරීමට ද කටයුතු කරමින් සිටී. මීට අමතරව, ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත දැනටමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. මෙම පනත බලාත්මක කිරීම මගින් අවසර නොලත් ණය ලබාදීමේ ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා සහාය ලැබෙනු ඇත.

**බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාමාර්ග ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.** බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම දිරිමත් කිරීමට සහ ඔවුන්ගේ ශක්තිමත් බව හා මැදි කාලීනව ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වසර ගණනාවක් මුළුල්ලේ ගෙන ඇති ක්‍රියාමාර්ග තවදුරත් වැඩි දියුණු කරමින් ලාභාංශ ප්‍රකාශ කිරීම හෝ ලාභ නැවත රැගෙන යෑම පිළිබඳව මාර්ගෝපදේශනයක් 2023 වසරේ දී නිකුත් කරන ලදී. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගැනීම හරහා ගනුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා සඳහා අඛණ්ඩව සහාය සපයන අතර, අවිනිශ්චිත කාල පරිච්ඡේදවල දී මූල්‍ය සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ ආර්ථික කම්පන අවශෝෂණය කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

## 2. 2024 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ග සහ ප්‍රතිපත්ති

### 2.1. මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ස්ථාවරය

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව යොමු කෙරෙනු ඇති අතරම එම ක්‍රියාමාර්ග ආර්ථිකයට එහි විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට පහසුකම් සලසනු ඇත. මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ රජය සමඟ එකඟ වී ඇති පරිදි කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය සියයට 5ක මට්ටමේ පවත්වා ගැනීම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ඉලක්කය වනු ඇත.[1]

වර්තමානයේ මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරයි. යටිදැරි උද්ධමන පීඩන අඩු වීම හේතුවෙන් 2023 ජූනි මාසයේ සිට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් ලිහිල් කරන ලදී. 2023 නොවැම්බර් මාසයේදී සිදු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමත් සමඟ තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල අඩු කිරීමක් නුදුරු කාලීනව සිදු නොවනු ඇත. මෙමගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් ලබාදෙනු ඇති අතර ආර්ථිකය මත අනවශ්‍ය පීඩන ඇතිවීම වළක්වනු ඇත. මෑත කාලීන බදු සහ තීරුබදු වැඩිවීම් හේතුවෙන් 2024 වසර තුළදී උද්ධමනය මත සැපයුම් අංශයේ පීඩන ඇතිවනු ඇත. කෙසේ වෙතත්, මෙම උද්ධමනය වැඩි වීම රජය ගත් පරිපාලන ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවන අතර උද්ධමන අපේක්ෂා මනාව පාලනය වී ඇති බැවින් මෙවැනි කෙටි කාලීන සැපයුම් බලපෑම් සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල වෙනසක් අවශ්‍ය නොවේ. යටිදැරි ඉල්ලුම් පීඩන මේ වන විට අඩු මට්ටමක පැවතිය ද උද්ධමන ඉදිරි දැක්මට බලපෑම් ඇති විය හැකි ආර්ථික ප්‍රවණතා පිළිබඳව මහ බැංකුව අවධානයෙන් සිටින අතර, එමගින් දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා සුදුසු පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

වෙළඳපොළ ණය පොලී අනුපාතික ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම සහ ආයෝජන හා ව්‍යාපාරික අපේක්ෂා වර්ධනය වීම මගින් පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණය ප්‍රසාරණය වීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එමගින් ආර්ථිකයට සිය විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට ඉඩ සලසනු ඇත. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම සඳහා බාධාවක් විය හැකි දේශීය මෙන්ම විදේශීය වශයෙන් පවතින අවදානම් සහ අභියෝග පිළිබඳව මහ බැංකුව අවධානයෙන් සිටියි.

ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රජයට මූල්‍යන ලබාදීම අවම කිරීම, උද්ධමන අපේක්ෂා පාලනය වීම සහ රජයේ සුරැකුම්පත් මත පැවති අවදානම් අධිමිල අඩු වීම මගින් මැදිකාලීනව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම සඳහා හිතකර බලපෑමක් ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා ඉදිරි කාලය තුළදී මහ බැංකුව විසින් රජයට ලබාදුන් ණය තොගය ක්‍රමයෙන් අඩු කරනු ඇත. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ අඛණ්ඩව දත්ත මත පදනම් වන අතර, මහ බැංකුවේ මූලික අරමුණවන දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සහ පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා සුදුසු පූර්වෝපායික ක්‍රියාමාර්ග ගනු ඇත.

---

[1] මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම 2023 ඔක්තෝබර් 05 දිනැති රජයේ ගැසට් (අතිවිශේෂ) අංක 2352/20හි ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්වීමේ අවශ්‍යතාවය සලකා බලමින් 2024 වසරේ සිට වසරක් තුළ සිදුකරන මුදල් ප්‍රතිපත්ති විවරණ සංඛ්‍යාව හයක් දක්වා අඩු කර ඇත. මුදල් ප්‍රතිපත්ති නිවේදන නිකුත් කිරීමේ පූර්ව දින දර්ශනයක් ඉදිරිපත් කිරීම සඳහා මහ බැංකුවේ කැපවීම පිළිබිඹු කරමින්, 2024 වසර සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම් දින සහ මුදල් ප්‍රතිපත්ති නිවේදන නිකුත් කිරීමේ දින ඇතුළත් දින දර්ශනය පහත පරිදි ප්‍රකාශයට පත් කෙරේ.

**2024 වසරේ මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කිරීමේ පූර්ව දින දර්ශනය**

| අංක | මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම | මුදල් ප්‍රතිපත්ති නිවේදනය |
|---|---|---|
| **1** | ජනවාරි 22 | ජනවාරි 23<br>***මුදල් ප්‍රතිපත්ති වාර්තාව - පෙබරවාරි 15*** |
| **2** | මාර්තු 25 | මාර්තු 26 |
| **3** | මැයි 28 | මැයි 29 |
| **4** | ජූලි 23 | ජූලි 24<br>***මුදල් ප්‍රතිපත්ති වාර්තාව - අගෝස්තු 15*** |
| **5** | සැප්තැම්බර් 26 | සැප්තැම්බර් 27 |
| **6** | නොවැම්බර් 26 | නොවැම්බර් 27 |

## 2.2. මුදල් - රාජ්‍ය මූල්‍ය සම්බන්ධීකරණය

ශ්‍රී ලංකා මහ බැංකු පනතෙන් නියම කර ඇති පරිදි 2023 වසර අවසාන කාලයේදී *'සම්බන්ධීකරණ සභාව'* පිහිටවූ අතර එමගින් රජයේ සහ මහ බැංකුවේ ප්‍රතිපත්ති එකිනෙකට බලපාන ආකාරය පිළිබඳ සවිස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා පහසුකම් සලසන ලදී. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මහ බැංකුවේ මුදල් හා මූල්‍ය ස්ථායිතා ප්‍රතිපත්ති අතර මනා සම්බන්ධීකරණයක් සහතික කිරීම සඳහා සම්බන්ධීකරණ සභාව කාර්තුමය වශයෙන් රැස්වෙනු ලැබේ. උද්ධමනය, මුදල් තත්ත්ව සහ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම පිළිබඳ විවරණයක් සමගින් මෑතකාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීම මහ බැංකුව විසින් මෙහිදී සිදු කෙරෙනු ඇත. සාමාන්‍යයෙන් මහ බැංකුවේ ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති මගින් පිළියම් යෙදීමට අපහසු සැපයුම් අංශයේ සාධක සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් උද්ධමනය වෙත බලපෑම් ඇති විය හැකි බැවින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් තුළ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය වැදගත් වේ. එවැනි අවස්ථාවන්හිදී උද්ධමනය, රජය සහ මහ බැංකුව ඒකාබද්ධව එකඟ වී ඇති උද්ධමන ඉලක්කයට වඩා වෙනස් විය හැකි අතර එය අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීමට හේතු වනු ඇත. පූර්වෝපායික ප්‍රතිපත්ති සම්බන්ධීකරණය එවැනි අවස්ථාවල බලපෑම් කළමනාකරණය කිරීමට උපකාරී වේ. තවද, මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලවල රාජ්‍ය නියෝජනයක් නොමැති අවස්ථාවක, ප්‍රධාන සාර්ව ආර්ථික තොරතුරු සහ ප්‍රතිපත්ති තීරණ නිසි කාලරාමුවක් තුළ හුවමාරු කිරීම හරහා මෙම යාන්ත්‍රණය මගින් රට තුළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ස්ථාවරභාවය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## 2.3. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ මූලිකාංගයක් වන සාමාන්‍ය ජනතාව ඇතුළු ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත ප්‍රතිපත්ති සන්නිවේදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. උද්ධමනයේ හා මූර්ත ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳ මහජනතාව මනාව දැනුම්වත් කිරීම සඳහා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තාව වසරකට දෙවතාවක් අඛණ්ඩව ප්‍රකාශයට පත් කෙරෙනු ඇති අතර එමගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විනිවිදභාවය සහ විශ්වසනීයත්වය තවදුරටත් ඉහළ නැංවෙනු ඇත. මේ අතර, මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ බාහිර විශේෂඥයින්ගේ සහ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අදහස් සහ උපදෙස්, පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටුව වැනි දැනට පවතින යාන්ත්‍රණ සහ වෙනත් ක්‍රම හරහා අඛණ්ඩව ලබා ගනු ඇත. තවද, ආර්ථිකයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන අතර, මහජන සහභාගීත්වය තවදුරටත් වැඩි දියුණු කිරීමට සහ තොරතුරු හා සන්නිවේදන පරතරය අඩු කිරීමට සැලසුම් සකස් කෙරෙනු ඇත. සාර්ව ආර්ථික ප්‍රවණතා, ප්‍රතිපත්ති සහ ඉදිරි දැක්ම පිළිබඳ වෘත්තීය ආයතන සහ වෘත්තිකයන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමුඛතාවය ගනු ඇති අතර ඉහළ මහජන සහභාගීත්වයක් සහ දැනුම්වත්භාවයක් මගින් සාවද්‍ය තොරතුරු ව්‍යාප්තවීම අවම කිරීමට අපේක්ෂා කෙරේ.

මහ බැංකුවට සෘජුවම පාලනය කළ නොහැකි සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා උද්ධමන පීඩන පාලනය කිරීම අවම අවස්ථාවන්වලදී එනම් තාවකාලික සැපයුම අංශයේ බලපෑම් හේතුවෙන් උද්ධමන පීඩන පවතින අවස්ථාවන්හීදී ඵලදායී හා කාලෝචිත සන්නිවේදනය උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා මහ බැංකුවට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුවේ සමස්ත සන්නිවේදන ක්‍රියාවලියේ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම සඳහා ද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කෙරෙනු ඇත. විශේෂයෙන්ම, ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශනවල අන්තර්ගතය සහ පරිශීලනය කිරීමේ හැකියාව වැඩි දියුණු කෙරෙන අතර මහ බැංකුවේ කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සන්නිවේදන ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා තොරතුරු නිතිපතා යාවත්කාලීන කිරීම්, විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ මහජනතාව සමඟ වැඩි වශයෙන් සම්බන්ධ වීම සඳහා පුළුල් පරාසයක සන්නිවේදන ක්‍රම උපායමාර්ගිකව භාවිතා කෙරෙනු ඇත.

## 2.4. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මූල්‍ය අතරමැදියන් සඳහා අරමුදල් සැපයීමේ ආන්තික පිරිවැය පිළිබිඹු කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතික පාලනය කිරීම හා සම්බන්ධ වේ. වත්මන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යෝග්‍ය මට්ටම්වල පවත්වා ගැනීම සඳහා 2024 වසරේදී ද්‍රවශීලතා පුරෝකථන රාමුව ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර එමගින් සඵලදායී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම අරමුණු වේ. **වඩා වැදගත් වශයෙන්, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මනාව වෙළඳපොළ වෙත සන්නිවේදනය වීම වැඩි දියුණු කිරීම සඳහා පවතින ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රියාවලියක් වෙත යොමු වීමට මහ බැංකුව සලකා බලනු ඇත.**

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් මෙන්ම වර්තමාන සහ අනාගත වෙළඳපොළ ප්‍රවණතා සපුරාලීමේ අරමුණින්, 2025 වසර වන විට විවට වෙළඳපොළ කටයුතු නව වෙන්දේසි ක්‍රමයක් වෙත ක්‍රමයෙන් යොමු වෙමින් ඒ සඳහා පරිශීලනය පහසු පද්ධතියක් හඳුන්වා දෙනු ඇත. **තවද, විවට වෙළඳපොළ කටයුතු සඳහා වෙන්දේසි කාලසටහනක් 2024 වසරේදී හඳුන්වා දෙනු ඇති අතර එය වෙළඳපොළ සහභාගීවන්නන් අතර ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ නිශ්චිතභාවයක් ඇති කිරීමට උපකාරී වනු ඇත.** විවට වෙළඳපොළ කටයුතු සඳහා වෙන්දේසි

කාලසටහන යනු සාමාන්‍යයෙන් මහ බැංකුව විසින් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා කළමනාකරණය කිරීම සඳහා විවට වෙළඳපොළ මෙහෙයුම් වෙන්දේසි පැවැත්විය යුතු දින පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමට සහභාගීත්ව ආයතන වෙත කල් ඇතිව ප්‍රකාශයට පත් කරන පූර්ව දින දර්ශනයකි.

**මහ බැංකුව විසින් ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්ට අනුකූලව දැනට පවත්නා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව සමාලෝචනය කරනු ඇත.** මෙමගින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල සංචිත කළමනාකරණය කිරීමේ නම්‍යශීලීභාවය වැඩි දියුණු කිරීම සහ ගෙවීම් පද්ධතියට සහාය වීම සිදු කරමින් මුදල් ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව භාවිතය ප්‍රශස්තකරණු ඇත. ආර්ථිකයට සහ මූල්‍ය පද්ධතියට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව ප්‍රශස්තකරණය කිරීමේ පුළුල් ඉලක්කය ඇතිව යෝජිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ශ්වකරුවන්ගේ අදහස් සඳහා යොමු කෙරෙනු ඇත.

**සහභාගීත්ව ආයතන මහ බැංකු පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අභියෝගයක් වූ අතර, ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට මහ බැංකුවට සිදු විය.** සහභාගීත්ව ආයතන අතර වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව පැවතීමේ සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කිරීමත් සමඟ අතිරික්ත මෙන්ම හිඟ ද්‍රවශීලතා සහිත සහභාගීත්ව ආයතන මහ බැංකු පහසුකම් මත අධික ලෙස රඳා පැවතුණු අතර ඒ හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය පහසුකම් භාවිතය සීමා කිරීමට මහ බැංකුවට සිදු විය. එවැනි ප්‍රතිපත්ති මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් නැවත සක්‍රීය කිරීමට සහාය වූ අතර විශාල ද්‍රවශීලතා හිඟයන් පැවති බැංකුවලට ද්‍රවශීලතා මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර නිවැරදි කිරීමේ පියවර හඳුන්වා දීම දිරිමත් කරවන ලදී. නිත්‍ය පහසුකම් මත පැනවූ සීමා යම් ධනාත්මක ප්‍රතිලාභ ලබා දී ඇත. වෙළඳපොළ හැසිරීමට බලපෑමක් නොවන පරිදි එවැනි සීමා ක්‍රමානුකූලව ඉවත් කිරීමට මහ බැංකුව සලකා බලනු ඇත. මේ අතර, ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්ට අනුකූලව බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන් මහ බැංකුව මත අධික ලෙස රඳා පැවතීම අවම කිරීම සඳහා විකල්ප යාන්ත්‍රණ මහ බැංකුව විසින් සොයා බලනු ඇත.

### 2.5. මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ තාක්ෂණික යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ඉදිරි දැක්මක් සහිත තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ඉතා වැදගත් වේ. ඒ අනුව, මහ බැංකුවේ සාර්ව ආර්ථික පුරෝකථන සඳහා පහසුකම් සැලසීමට සහ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට සහාය වීම සඳහා 2017 වසරේ සිට ක්‍රියාත්මකවන පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (Forecasting and Policy Analysis System, FPAS) මගින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව මෙහෙයවනු ඇත. සාර්ව ආර්ථික ඉදිරි දැක්ම පුරෝකථනය කිරීම සඳහා දැනට භාවිතයේ පවතින කාර්තුමය පුරෝකථන ආකෘතිය ඇතුලු ආකෘති කිහිපයක් භාවිත කෙරෙනු ඇත. විකල්ප ආකෘති පිළිබඳ විමර්ශනය කිරීම සහ පවතින ආකෘතීන් අඛණ්ඩව වැඩි දියුණු කිරීම වඩාත් නිවැරදි පුරෝකථන කිරීමට ඉඩ සලසන අතර එමගින් පුළුල් සාර්ව ආර්ථික විශ්ලේෂණ ක්‍රියාවලියකට සහ දත්ත පදනම් කරගත් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට මග පාදයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට මනා සහායයක් ලබා දීම සඳහා ආකෘතිකරණ සහ පුරෝකථන කිරීමේ හැකියාවන් තවදුරටත් වැඩි දියුණු කෙරෙනු ඇත. වැඩි දියුණු කරන ලද ආකෘතිකරණ සහ පුරෝකථන කිරීමේ හැකියාවන් සමඟ උද්ධමනය සහ අනෙකුත් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්හි පුරෝකථන පථයන්හි නිරවද්‍යතාවය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එවැනි පුරෝකථන හා සම්බන්ධ අවදානම් ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට විනිවිදභාවයෙන් යුතුව දැනුම් දෙනු ඇත. තවද, මහ බැංකුව තුළ ප්‍රතිපත්ති පර්යේෂණ වැඩි දියුණු කිරීම සහ ඵලදායී පර්යේෂණ

සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම සහයෝගීතා පර්යේෂණ පුළුල් කිරීම යනාදිය ප්‍රමුඛතා ක්ෂේත්‍ර වනු ඇති අතර එමගින් ප්‍රතිපත්ති විශ්ලේෂණ ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇත.

## 2.6. විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම

**විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙන් සහය ලබන වැඩසටහන සාර්ථකව අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාම, පවතින වෙළෙඳපොළ අවිනිශ්චිතතා ඉවත් කිරීමට සහ ආයෝජක විශ්වාසය තිරසාර පදනමකින් යුතුව වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත.**

ආනයන වියදම් අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම හමුවේ, වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් ඉහළ නැංවීම සඳහා අපනයන අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම තුළින් ශ්‍රී ලංකාව විදේශීය ජංගම ගිණුමේ හිඟය මැදි කාලීනව තිරසාර මට්ටම් දක්වා අඩු කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, සේවා වෙළඳාමේ වැඩි දියුණු වූ අතිරික්තය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ඉහළ යාම විදේශීය ජංගම ගිණුමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සාර්ව ආර්ථික ස්ථායීතාව යළි ඇති කිරීමේ ප්‍රයත්නයන්ට අමතරව, දිගින් දිගටම ඇතිවන ගෙවුම් ශේෂ අර්බුද විසඳීම සඳහා වෙළඳ භාණ්ඩ අපනයනය සහ සේවා වෙළඳාම යන දෙඅංශය ප්‍රවර්ධනය කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්න දැරීම අත්‍යවශ්‍ය වේ. තවද, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනය තිරසාරව පවත්වා ගැනීම සහ ණය නොවන වගකීම් වන විදේශ මූල්‍යයන ලැබීම් ආකර්ෂණය කර ගැනීම විදේශීය අංශයේ කල්පවත්නා ස්ථාවරත්වයක් සහතික කිරීම සඳහා උපකාරී වනු ඇත.

බාහිර කම්පනවලට එරෙහිව ස්වාරක්ෂකයක් ලෙස කටයුතු කිරීම සඳහා වෙළෙඳපොළ මගින් තීරණය වන සහ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑමට මහ බැංකුව කැපවී සිටියි. වෙළෙඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම සංචිත ගොඩ නැගීම සඳහා සහ විනිමය අනුපාතිකයේ ඇතිවන කිසියම් අධික උච්චාවචන සීමා කිරීම සඳහා පමණක් සීමා වනු ඇත. වෙළෙඳපොළ මගින් තීරණය වන විනිමය අනුපාතික මගින් අතීතයේ පැවති අපනයන විරෝධී නැඹුරුව සහ සමපේක්ෂණ පීඩන අනවශ්‍ය ලෙස නිර්මාණය වීම හා එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විනිමය අනුපාතිකයේ උච්චාවචනය නිවැරදි කිරීමට උපකාරී වනු ඇත. මීට අදාළව, විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවයට තවදුරටත් සහාය සැපයීම සඳහා, පුළුල් සහ වඩාත් ද්‍රවශීල විදේශ විනිමය වෙළෙඳපොළක් ඇති කිරීමට සහ විනිමය අනුපාතික අවදානම් කළමනාකරණය සඳහා ප්‍රමාණවත් ලෙස පද්ධති සංවර්ධනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. දේශීය වෙළෙඳපොළ තුළ විදේශ විනිමය ජාත්‍යන්තර භාවිත/කේත ක්‍රියාත්මක කිරීම මගින් වෙළෙඳපොළ සහභාගීවන්නන්ට පවතින වෙළෙඳපොළ තොරතුරු පිළිබිඹු කරන මිල ගණන් යටතේ විශ්වාසයෙන් හා ඵලදායී ලෙස ගනුදෙනු කළ හැකි ශක්තිමත්, සාධාරණ, ද්‍රවශීල, විවෘත සහ නිසි විනිවිදභාවයක් සහිත වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාර්ගෝපදේශ මාලාවක් සැපයීම මේ සඳහා තවදුරටත් සහාය වනු ඇත.

බාහිර ස්වාරක්ෂක නැවත ගොඩ නැගීම ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ ඇති මූලික අවශ්‍යතාවලින් එකකි. විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීමෙන් බාහිර ස්වාරක්ෂක නැවත ගොඩ නැගීමට මහ බැංකුව කැපවී සිටී. ඉදිරි කාලය තුළ සංචිත ප්‍රමාණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ස්වාරක්ෂක ගොඩනැගීම සඳහා 2024 වසරේ දී දළ නිල සංචිත මට්ටම තවදුරටත් වැඩි කරනු ඇත.

බැංකු පද්ධතියෙන් දෛනිකව සිදුවන දේශසීමා ගනුදෙනු සහ විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා මහ බැංකුව 2023 වසරේ දී ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ (ITRS) පළමු අදියර සාර්ථකව දියත් කළේය. **2024 වසරේ සිට ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත**

**මත පදනම්ව විදේශීය ජංගම ගිණුමට, විශේෂයෙන් ම සේවා වෙළඳාමට අදාළ මාසික දත්ත වාර්තා කිරීමට මහ බැංකුව සැලසුම් කරයි.** මින් ඉදිරියට, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ වර්ධනය සඳහා අඛණ්ඩව සහාය දෙන ලෙසත්, දත්තවල ආවරණය, නිරවද්‍යතාවය සහ කාලෝචිතභාවය සහතික කරන ලෙසත් සියලුම බැංකුවලින් ඉල්ලා සිටිමු.

## 3. 2024 සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති

### 3.1. බැංකු අංශයේ ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම සහ මූර්ත අංශය වෙත සුමටව ණය ගලා යෑම පිළිබඳ නිශ්චිත අපේක්ෂා සමඟ, බැංකු අංශයේ මූල්‍ය හා මෙහෙයුම් අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමේ අරමුණින්, නුදුරු හා මැදි කාලීනව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

ශක්තිමත් සහ ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වූ බලපත්‍රලාභී බැංකු පවත්වා ගැනීමේ අරමුණ ඇතිව, මහ බැංකුව විසින් වත්කම් අනුව විශාල බැංකු නවය සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම සඳහා පෙර දැක්මක් සකස් කර ඇත. විවිධ සාර්ව මූල්‍ය රාමු සහ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම මත පදනම් වූ නිර්ණන ක්‍රියාවලියක් සහ ඉදිරි දැක්මක් සහිත ආතති පරීක්ෂණයක් තුළින් හඳුනාගෙන ඇති ප්‍රාග්ධන සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් පියවීමට මෙමගින් උත්සාහ දරයි. පෙර දැක්මට අනුකූලව, 2024 මුල් භාගයේ දී එවැනි බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් අනුමත කරන ලද ප්‍රාග්ධනීකරණ සැලසුම් මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නිර්ණන ක්‍රියාවලිය සහ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පැන නගින, ප්‍රාග්ධනයට ඇති විය හැකි බලපෑම් ආවරණය කිරීම සඳහා රජය විසින් 2024 ජාතික අයවැයෙන් අයවැය ප්‍රතිපාදන රු. බිලියන 450ක් වෙන් කර ඇත.

අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ අධීක්ෂණ රාමුවකට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ තීව්‍ර කළ යුතු අතර, පූර්ව අනතුරු ඇඟවීම් නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම තුළින් අඛණ්ඩව ආවේක්ෂණ ශක්තිමත් කළ යුතුය.

බැංකු පනතට යෝජිත සංශෝධන හරහා බලපත්‍රලාභී බැංකුවල නීතිමය සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට නියමිතය. යෝජිත ප්‍රධාන සංශෝධන අතරට අවම බලපත්‍ර අවශ්‍යතා ශක්තිමත් කිරීම, ආයතනික පාලනය, කොටස් හිමියන්ගේ යෝග්‍යතාවය, අවශ්‍ය යැයි සැලකෙන පරිදි විදේශීය බැංකු අනුබද්ධකරණය කිරීම, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එකතු කිරීම් සහ ඒකාබද්ධ කිරීම්, මූල්‍ය නොවන අනුබද්ධ ආයතන බැහැර කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, ගිණුම් සහ විගණනය, සමානුපාතිකතාව, විශාල නිරාවරණය, සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු ඇතුළත් වේ. බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2024 මුල් භාගයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට අපේක්ෂා කෙරේ.

තවද, ජාත්‍යන්තර නියාමකයන් විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන් සහ මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද පාලන නිර්ණ වාර්තාවේ ඇතුළත් ප්‍රධාන නිර්දේශයන් ද ඇතුළත් කරමින් ආයතනික පාලනය පිළිබඳ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ.

බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම, අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති පුද්ගලයින් සඳහා අනුමැතිය ලබා දීම තුළින් ශක්තිමත් කිරීමටත්, එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ නිපුණතා වැඩිදියුණු කිරීමටත් බලාපොරොත්තු වේ. විශේෂයෙන් ම, බැංකු අංශයේ වත්කම්වලින්

සියයට 48කට හිමිකම් කියන රාජ්‍ය බැංකු සම්බන්ධයෙන්, එවැනි බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සඳහා මුදල් අමාත්‍යාංශයට මාර්ගෝපදේශ නිකුත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. ඒ අනුව, රාජ්‍ය බැංකුවල පාලනය ශක්තිමත් කිරීම සඳහා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩලවලට ස්වාධීන සාමාජිකයින් බහුතරයක් සිටීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා නාමයෝජනා සිදු කිරීමේ දී බැංකු නාමයෝජනා කමිටු විසින් වෘත්තීය පළපුරුද්ද සහ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා පැහැදිළි අවශ්‍යතා සහිත විවෘත සෙවුම් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම යන අවශ්‍යතා හඳුන්වාදෙමින් රාමුවක් සකස් කිරීමට නියමිත වේ.

අතීතයේ දී අරමුදල් සපයා ගැනීම සඳහා රජය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් පද්ධතිමය වශයෙන් වැදගත් වන රාජ්‍ය බැංකු මත අධික ලෙස රඳා පැවතීම හේතුවෙන් මූල්‍ය පද්ධතියට සැලකිය යුතු මට්ටමක අභියෝග එල්ලවී ඇත. බැංකුවලට, රජය සතු වාණිජ ව්‍යවසායයන් ද ඇතුළුව, තනි ණය ගැතියකු සහ සම්බන්ධිත ණය ගැතියන් කණ්ඩායමක් හා අදාළ වන ඉහළ නිරාවරණයන් සඳහා අවශ්‍ය විචක්ෂණ සීමාවන් නියම කරන උපදෙස් සකස් කිරීමේ ක්‍රියාවලියක මහ බැංකුව නිරතව සිටියි. මෙම තත්ත්වයන් හමුවේ, රජය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ විශාල සමාගම්වලට ඔවුන්ගේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමට සහ අරමුදල් ප්‍රභව විවිධාංගීකරණය කිරීමට සිදු විය හැකිය.

මෑත කාලීන අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල තිරසාර පුනර්ජීවනයට පහසුකම් සැලසීම සහ බලපත්‍රලාභී බැංකුවල ඉහළ මට්ටමක පවතින අවදානම් සහගත වත්කම් නිසි ලෙස හැසිරවීම සහතික කිරීම අරමුණු කරගනිමින්, විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ සමාගම් ආදී ව්‍යාපාර යළි නඟා සිටුවීමට  බැංකුවලින් සිදු විය යුතු කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර පුනර්ජීවන ඒකක පිහිටුවීම බලාත්මක කිරීම සඳහා මහ බැංකුව පුළුල් මාර්ගෝපදේශ නිකුත් කිරීමට නියමිතය. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය දීමේ දී ඇති විය හැකි ණය අවදානම අවම කරන අතරම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහාය වීම සඳහා ණය ඇපකර ලබා දෙන ජාතික ණය ඇපකර ආයතනයක් දැනට රජය විසින් ස්ථාපනය කර ගෙන යමින් සිටී. මෙම ප්‍රයත්නයන් හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීමට මූල්‍ය ආයතන තවදුරටත් දිරිමත් කරනු ඇත.

තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල දායකත්වය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර, බලපත්‍රලාභී බැංකු සඳහා තිරසාර සහ දේශගුණික විපර්යාස අවම කිරීම හා අනුවර්තනය වීම සඳහා වන ව්‍යාපෘති මූල්‍යන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීමේ යාන්ත්‍රණ හඳුන්වා දෙනු ලැබේ. මෙය තිරසාර මූල්‍ය පෙර දැක්මට අනුකූල වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, මීට  අදාළ ව බැංකු අංශයේ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සඳහා ද මහ බැංකුවේ සහාය හිමි වනු ඇත.

මැදි කාලීනව, කුඩා හා මධ්‍ය පරිමාණයේ බැංකු විසින් පරිමාණය, කාර්යක්ෂමතාව සහ මූල්‍ය ශක්තිය සම්බන්ධ සහයෝගීතා ඇති කිරීම සඳහා සුදුසු මූල්‍ය ආයතන අත්පත් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම මගින් ස්ථායීතාව ඇතිකිරීමට මාර්ග සොයනු ඇතැයි අපේක්ෂා කරන අතර, මහ බැංකුව එවැනි වෙළෙඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සලසනු ඇත. මැදි කාලීනව නියාමන සහ අධීක්ෂණ ක්‍රියාවලි තුළට 'SupTech' විසඳුම් හඳුන්වා දීමෙන් දැනට පවතින අධීක්ෂණය කිරීමේ ධාරිතාවය ද ශක්තිමත් කරනු ඇත.

බැංකු ක්ෂේත්‍රයේ ශක්තිමත් බව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය අංශයේ නියාමකයින් සහ මුදල් අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව සමීපව සම්බන්ධ වී සහයෝගීතාවෙන් යුතුව කටයුතු කරනු ඇත.

## 3.2. බැංකු නොවන අංශයේ ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

ශක්තිමත් සහ ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන ගොඩනැගීමේ අරමුණින් 2024 වසරේ දී ආරම්භ වන බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්මේ දෙවන අදියර [2] ක්‍රියාත්මක කිරීම තුළින් බැංකු නොවන අංශයේ ස්ථාවරත්වය තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතට සහ 2000 අංක 56 දරන මූල්‍ය ලීසිං පනතට අදාළ සංශෝධන ඇතුළුව, වත්මන් වෙළෙඳපොළ වර්ධනයන් සමඟ අනුකූල වන පරිදි, පවතින නියාමන රාමුව තවදුරටත් සංශෝධනය කිරීම තුළින් බැංකු නොවන අංශයේ අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරම, එම අංශයේ ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සඳහා නීති රීති හඳුන්වාදීම හෝ නැවත සමාලෝචනය කිරීමට ද අපේක්ෂා කෙරේ.

තවද, යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත යටතේ නියාමන රාමුව ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව බලධාරීන්ට සහාය වනු ඇත. මහ බැංකුව විසින් යෝජනා කර ඇති මෙම පනත මගින් වෙළෙඳපොළ හැසිරීම සහ පාරිභෝගික ආරක්ෂාව වැඩිදියුණු කිරීම මෙන්ම, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට අමතරව නියාමන විෂය පථය තුළ නියාමනය නොකළ අනෙකුත් සියළු ණය ආයතන නියාමන රාමුව තුළට ඇතුළත් කිරීමට ද අපේක්ෂා කරයි. මෙම පනත කඩිනමින් පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට බලාපොරොත්තු වේ.

## 3.3. ගෙවීම් සහ පියවීම් පද්ධති

2023 වසර තුළ දී මහ බැංකුව රටේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල මෙහෙයුම් කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය අඛණ්ඩව සහතික කළ අතර, 2024 වසරේ දී ඩිජිටල් ගනුදෙනුවල සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කරයි.

ගෙවීම් සහ පියවීම් නියාමන රාමුව සංවර්ධනය කිරීමේ අදහසින්, ගෙවීම් නවෝත්පාදනවල වේගවත් ව්‍යාප්තියක් ඇති කිරීම සඳහා පහසුකම් සැලසීමට 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සංශෝධනය කිරීමටත්, 2025 වසරේ දී නව ගෙවීම් සහ පියවීම් පද්ධති පනත බලාත්මක කිරීමටත් මහ බැංකුව අරමුණු කරයි. තවද, ඩිජිටල් ගෙවීම් පුළුල් කිරීමට සහාය දැක්වීම සඳහා රෙගුලාසි සංශෝධනය කිරීමටත්, නියාමන පරීක්ෂණ අවකාශය (Regulatory Sandbox) තුළට නව මූල්‍ය තාක්ෂණ ඇතුළත් වීම සඳහා පහසුකම් සැලසීමට පවතින නියාමන පරීක්ෂණ අවකාශ රාමුව සංශෝධනය කිරීමටත් මහ බැංකුව අපේක්ෂා කරයි.

සුළු පරිමාණ ගෙවීම් සඳහා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන්, මහ බැංකුවේ මගපෙන්වීම යටතේ LankaPay සීමාසහිත පෞද්ගලික සමාගම විසින් රාජ්‍ය ආයතනවලට LankaPay ඔන්ලයින් ගෙවීම් පද්ධතිය හරහා මහජනතාවගෙන් ඩිජිටල් ක්‍රමය යටතේ ගෙවීම් ලබාගැනීමට රාජ්‍ය ඩිජිටල් ගෙවීම් පද්ධතිය සංවර්ධනය කරයි. ඩිජිටල් ක්‍රමය යටතේ නැවත නැවත සිදු කරන ගෙවීම් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, මහ බැංකුව විසින් සෘජු හර ක්‍රමය ක්‍රියාත්මක කිරීම බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය කිරීමට ද අපේක්ෂා කරන අතර, එමගින් අනුමත තෙවන පාර්ශ්වීය ආයතනයකට නියමිත දිනට ගනුදෙනුකරුගේ බැංකු ගිණුමෙන් යම් නිශ්චිත සීමාවක් දක්වා ගෙවීමක් ස්වයංක්‍රීයව ලබා ගැනීමට හැකි වේ.

විද්‍යුත් මුදල් සේවා හරහා ඩිජිටල් ගනුදෙනු සහ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා, 2024 වසරේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩිදියුණු කරන ලද විද්‍යුත් මුදල් ගිණුම් (enhanced e-money accounts) සහ මූලික විද්‍යුත් මුදල් ගිණුම්වල (basic e-money accounts) ගෙවීම් සීමා ඉහළ නංවන

[2] ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්මෙහි I අදියර අවසන් වෙමින් පවතින අතර එහි ගනුදෙනු 7ක් සම්පූර්ණ කර තවත් ගනුදෙනු 2ක් සිදු වෙමින් පවතී.

ලදී. තවද, දේශීය ගනුදෙනුකරුවන්ට සහ විදේශිකයන්ට ශ්‍රී ලංකාව තුළදී සිදු කරන ගෙවීම් සඳහා LANKAQR භාවිතා කිරීමට හැකි වන පරිදි විදේශීය ගෙවීම් යෙදුම් හරහා ද එය භාවිතා කිරීමට ඉඩ සලසමින් LANKAQR පුළුල් කෙරේ.

මහ බැංකුව විසින් හඳුනාගෙන ඇති පරිදි මහජනතාව අතර ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින ප්‍රධාන අභියෝගයක් වන්නේ ඩිජිටල් ගනුදෙනුවල උපයෝජ්‍යතාව, ක්‍රමවේද සහ ප්‍රතිලාභ පිළිබඳ දැනුම්වත්භාවය නොමැතිකමයි. එබැවින්, 2024 වසර තුළ දී, ඩිජිටල් ගෙවීම් ක්‍රම ආශ්‍රිත ආරක්ෂක අංග සහ මහජනතාවට සිදු විය හැකි වංචා හා කූටෝපක්‍රම වැනි තර්ජන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ සැසි අඛණ්ඩව පැවැත්වීමට මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, සියලුම ගෙවීම් සේවා සපයන්නන් විසින් ගනුදෙනුකරුවන් වෙත සියලු හර සහ බැර ගනුදෙනු සඳහා තත්‍ය කාලීන දැනුම් දීම් යැවීම මහ බැංකුව අපේක්ෂා කරයි.

### 3.4. පාරිභෝගික සබඳතා ඉහළ නැංවීම

2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවල දක්වා ඇති ප්‍රධාන නියාමන පියවර ක්‍රියාත්මක කිරීමට සහ මහ බැංකුවේ විෂය පථය යටතේ නියාමනය වන මූල්‍ය ආයතනවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින් වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය ආරම්භ කිරීම මගින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ විශ්වාසය සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛත්වය දෙන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මහ බැංකුවේ ක්‍රියාකාරී ප්‍රවේශය අවධාරණය කරනු ලබයි. කම්පන දරා ගැනීමට හැකි වීම පමණක් නොව ඉහළම සදාචාරාත්මක ප්‍රමිතීන් ද සුරක්ෂිත කරන මූල්‍ය පරිසර පද්ධතියක් ගොඩනැගීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් මෙම ක්‍රියාමාර්ග තුළින් පිළිඹිබු කරයි. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ රට පුරා ඵලදායී මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගත් වැදගත් ප්‍රයත්නයකි.

විචක්ෂණශීලී සන්නිවේදන උපායමාර්ග හරහා මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය ගොඩනැගීම, ස්ථාවරත්වය පවත්වා ගෙනයෑම සඳහා වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගත් කළ, ආර්ථික අර්බුදකාරී කාලපරිච්ඡේදයක් තුළ දී විශ්වාසය නැවත ඇති කිරීම සහ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා මහ බැංකුවට ඉක්මන් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට හැකි වීම සහතික කිරීමට අර්බුද අවස්ථාවල දී සන්නිවේදනය සඳහා අනුගමනය කළ යුතු ශක්තිමත් ක්‍රියාපිළිවෙලක් සකස් කිරීමට හා එය නිරතුරුව යාවත්කාලීන කිරීමට නියමිතය. තවද, නිරන්තර අවදානම් තක්සේරු කිරීම් මහජනතාවට දැනුම් දීම ප්‍රමුඛතා පදනමකින් සිදු කරනු ඇත. ඉදිරියේ දී ඇති විය හැකි මූල්‍ය අභියෝග පිළිබඳව දැනුම සක්‍රීයව හුවමාරු කර ගැනීමෙන්, එම තත්ත්වවලට පාර්ශ්වකරුවන් වඩාත් හොඳින් සූදානම් වී සහ දැනුවත් වී සිටිනු ඇති අතර, එය වඩාත් ස්ථාවර මූල්‍ය පරිසරයකට දායක වනු ඇත.

## 4. පුළුල් ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්ති

මූලික කාර්යයන්ට අමතරව, පුළුල් ආර්ථිකය සහ මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව නියෝජිත කාර්යයන් කිහිපයක නිරත වේ. ඉදිරි කාලසීමාව තුළ දී මෙම ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් මෙම කොටසෙහි සාරාංශ කර ඇත.

### 4.1. රාජ්‍ය ණය කළමනාකරණය

සාර්ව ආර්ථික ස්ථායිතාව සහ තිරසාර රාජ්‍ය මූල්‍ය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල මනා සම්බන්ධීකරණය සහතික කරමින් රජය සමඟ ඵලදායී සහයෝගීතාවයකින් කටයුතු කිරීම හරහා රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් මහ බැංකුව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. 2023 වසරේ දී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන අවසන් කිරීමෙන් පසුව, ණය කළමනාකරණය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා 2024 වසරේ දී මුලපිරීම් කිහිපයක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

විශේෂයෙන්, අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමින් බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමට අඛණ්ඩව දායක වනු ඇත. විදේශීය පුද්ගලික ණය හිමියන්ටත් සමාන ලෙස සැලකෙන කොන්දේසි සහිතව කඩිනම් විසඳුමක් ඇති කර ගැනීම වෙළෙඳපොළ අවිනිශ්චිතතා ඉක්මනින් පහව යෑමට ද දායක වන අතර, එමගින් රජයේ සුරැකුම්පත්වලට අදාළ අවදානම් අධිමිල අඩු වීම හරහා අපේක්ෂිත ආකාරයට ඵලදා වක්‍රය පහළට ගෙන ඒමට ද උපකාරී වනු ඇත.

තවද, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාංශය පිහිටුවීම සඳහා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශයට සහාය ලබා දෙනු ඇත. මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට යෝජිත මෙම කාර්යාංශය රටේ රාජ්‍ය ණය කළමනාකරණයේ වගකීම දරන එකම අධිකාරිය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන්, රාජ්‍ය ණය කළමනාකරණ පනත 2024 වසරේ මාර්තු වන විට බලාත්මක කිරීමට අපේක්ෂිත අතර, ඒ හරහා 2024 වසරේ දෙසැම්බර් වන විට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාංශය පිහිටුවා එහි වැඩකටයුතු ආරම්භ කිරීමට නියමිතය.

### 4.2. විදේශ විනිමය කළමනාකරණය

විදේශ විනිමය කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කළ, මහ බැංකුව විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ රෙගුලාසි, නියෝග සහ විධාන මගින් පූර්වෝපායික සහ කාලෝචිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත. පාර්ශ්වකරුවන්ගේ ගැටලු සම්බන්ධව කටයුතු කිරීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ නියාමනය කිරීම සහ විදේශ විනිමය ගලා ඒම් සහ පිටතට ගලායාම පිළිබඳ ආවේක්ෂණය ශක්තිමත් කිරීම සිදු කරන අතර, මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් රට වෙත විදේශ විනිමය ගලා ඒම් තවදුරටත් ප්‍රවර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එපමණක් නොව, පවතින විදේශ විනිමය රෙගුලාසි වලට අනුකූල වීම වැඩි දියුණු කිරීම සඳහා, අදාළ ප්‍රධාන පාර්ශ්වකරුවන් (බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙන්දන් සහ මහජනතාව) තුළ දැනුම්වත්භාවය අඩු ක්ෂේත්‍ර සක්‍රියව හඳුනා ගැනීම සහ එම ගැටලු සුදුසු පරිදි විසඳීම ඩිජිටල් ක්‍රමවේද හරහා අඛණ්ඩව සිදු කළ යුතුය.

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතා තත්ත්වයෙහි නිරීක්ෂණය වූ වැඩිදියුණු වීම් සමඟ මහ බැංකුව විසින් ඇතැම් ප්‍රාග්ධන විදේශ විනිමය පිටතට ගලා යෑම් සඳහා පවතින සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමේ අදහස ඇතුව ප්‍රමුඛතා පදනම මත එම සීමාවන් සමාලෝචනය කරනු ඇත.

2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතිය තවදුරටත් ප්‍රශස්ත කරනු ඇති අතර, එමගින් අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අධීක්ෂණ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහතික වනු ඇත.

තවද, විධිමත් විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය වඩාත් කාර්යක්ෂමව නියාමනය කිරීමට අවශ්‍ය රාමුව සපයමින් විදේශ විනිමය පනත සඳහා අවශ්‍ය සංශෝධන 2024 මුල් භාගයේ දී අවසන් කර බලාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, විදේශ විනිමය ගනුදෙනුවලට අදාළ නීති උල්ලංඝනය කිරීම්වලට සහ /හෝ අනුකූල නොවීම්වලට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට නියාමන බලධාරීන්ට බලය ලබා දීම සිදු වනු ඇත.

### 4.3. මූල්‍ය බුද්ධි ඒකකය

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව කටයුතු කිරීමට රටේ පවතින ක්‍රියාමාර්ග තක්සේරු කිරීම සඳහා, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ තුන් වන අන්‍යොන්‍ය ඇගයීම 2025 මාර්තු මාසයේ දී ආරම්භ කිරීමට නියමිතය. මූල්‍ය කාර්යසාධක බලකායේ නිර්දේශ හතළිහට තාක්ෂණිකව අනුකූල වන බවට සහ ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ මෙරට පවතින රාමුව මූල්‍ය කාර්යසාධක බලකායේ ක්ෂණික ප්‍රතිඵල 11 යටතේ ඵලදායී වන බවට ශ්‍රී ලංකාව විසින් සහතික කළ යුතුය. මෑතක දී සිදු කෙරුණු 2021/22 වර්ෂය සඳහා වන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම ඇගයීමෙන් පසුව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ රාමුවේ පවතින හිඩැස් සහ ඌනතා කිහිපයක් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන්, දැනට පවතින අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගෙනහැර දක්වන, ආයතන අනුව සකස් කෙරුණු ක්‍රියාකාරී සැලසුම් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. මෙම ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කරමින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ගෝලීය නිර්දේශ සපුරාලීම සඳහා මෙම ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් දැනටමත් දැනුම්වත් කර ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ කාර්යසාධක බලකායක් 2024 ජනවාරි මාසයේ දී ස්ථාපිත කිරීමට නියමිත අතර මූල්‍ය බුද්ධි ඒකකය මෙම කාර්යසාධක බලකායේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කරනු ඇත. ආයතන අනුව සකස් කෙරුණු ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීම සඳහා මෙම කාර්යසාධක බලකාය බලගැන්වීමට නියමිත අතර, 2026 වසරේ ජූලි මාසයේ දී අන්‍යොන්‍ය ඇගයීම සාර්ථකව නිම කරන තෙක් මෙම කාර්යසාධක බලකාය ක්‍රියාත්මක වීමට නියමිතය.

මීට අමතරව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රයත්න කෙරෙහි මූලික අවධානය යොමු කරමින් විවිධ නියාමන අධිකාරීන් අතර ඵලදායී සහයෝගීතාව සහ තොරතුරු හුවමාරු කර ගැනීමේ වැඩපිළිවෙළක් ඇති කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ විෂය පථය යටතේ අන්තර්-නියාමන ආයතනයක් පිහිටුවීමට පියවර ගැනීමට නියමිතය.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ප්‍රධාන නීති පනත් තුන, එනම්, 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, සඳහා සංශෝධන හඳුන්වා දීමේ ක්‍රියාවලියක මූල්‍ය බුද්ධි ඒකකය නිරතව සිටියි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සංශෝධනය හරහා ව්‍යවස්ථාපිත විධිවිධාන තුළ විධිමත් කිරීමට නියමිතය. මෙම සංශෝධන 2024 වසරේ දී බලාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය බුද්ධි ඒකකයෙහි ඉල්ලීම පරිදි, ශ්‍රී ලංකා පොලිසිය විසින් විවිධ වංචා, තහනම් පිරමීඩ යෝජනා ක්‍රම සහ අනවසර ලෙස තැන්පතු භාර ගැනීමේ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය විසින් විවිධාකාරයෙන් පැමිණිය හැකි නොයෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් හඳුනාගෙන අදාළ බලධාරීන් දැනුම්වත් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත. මේ අතර, දත්ත වාර්තා කරන ආයතනවල ආවරණය ඉහළ නැංවීම සඳහා කටයුතු කරන අතරම, 'goAML' මාර්ගගත වාර්තාකරණ සහ විශ්ලේෂණ පද්ධතිය හරහා උපායමාර්ගික විශ්ලේෂණ සිදු කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අපේක්ෂා කරයි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ නීතිමය සහ නියාමන රාමුව සමඟ දත්ත වාර්තාකරණ ආයතනවල ඇති අනුකූලතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ආයතනවල සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සඳහා අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් යටතේ එතැන් පරීක්ෂණ / විතැන් සමාලෝචන සිදු කිරීමට අපේක්ෂිතය.

### 4.4. ප්‍රාදේශීය සංවර්ධනය

ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමෙන් පසුව, ප්‍රාදේශීය සංවර්ධනයේ මූලික අවධානය, අතරමැදියන් හරහා මූල්‍ය පහසුකම් සැපයීමේ සිට ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම වෙත යොමු වූ අතර, ඉහළ අන්තර්ගතභාවයක් සහ වඩාත් තිරසාර මූල්‍ය පද්ධතියක් ගොඩනැගීම පිළිබඳ අවධානය යොමු කිරීමේ පුළුල් අවශ්‍යතාවය පිළිබිඹු කරයි.

මහ බැංකුව මගින් අරමුදල් සපයන ලද යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි ප්‍රතිපාදන ඇතුළත් නොවන බැවින්, මහ බැංකුව එවැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම අවසන් කරන ලදී. ඒ වෙනුවට, ඉදිරියේ දී, මුදල් අමාත්‍යාංශය විසින් එවැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන අතර, එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ධාරිතාවය ඉහළ නංවාගැනීමට මහ බැංකුව සහාය වනු ඇත. මේ අතර, නව රැකියා අවස්ථා ඇති කිරීම සහ ප්‍රාදේශීය වශයෙන් වූ ආදායම් විෂමතා අවම කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා මහ බැංකුව දැනටමත් ක්‍රියාත්මක වන ණය සහ ණය පරිපූරක වැඩසටහන්, බලපත්‍රලාභී බැංකු හරහා දැරිය හැකි පිරිවැයක් යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීත්ව පාලන රාමුවක් තුළ, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලයේ දී ක්‍රියාත්මක කිරීම සහතික කරමින්, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග සැලැස්මෙහි පළමු අදියර 2024 වසරේ දී අවසන් කිරීමටත්, දෙවන අදියර 2025 වසරේ දී ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කෙරේ. මීට අමතරව, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග සැලැස්ම යටතේ මූල්‍ය සාක්ෂරතාවය සඳහා විස්තීර්ණ මාර්ග සිතියමක් ගොඩනැංවීම ආරම්භ කරනු ලබන අතර, එය 2024 වසරේ මුල් කාලයේ දී දියත් කිරීමට බලාපොරොත්තු වේ. එමගින් මූල්‍ය සාක්ෂරතාව ඇති ප්‍රජාවක් ගොඩ නැගීම සඳහා ගනු ලබන සියලු උත්සාහයන්, එක් ප්‍රතිපත්තිමය දිශානතියක් යටතේ ඒකාබද්ධ කෙරේ.

තවද, මෙම උපාය මාර්ගය මගින් මූල්‍ය සේවා අඩුවෙන් ලබන සහ මූල්‍ය සේවා නොලබන ජනතාවගේ ජීවනෝපාය නඟාසිටුවීම අරමුණු කරගත් ප්‍රයත්නයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කටයුතු ශක්තිමත් කිරීමට සහ ප්‍රාදේශීය මට්ටමින් විවිධ ජන කණ්ඩායම්වල ජනතාව අතර මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමටත් අපේක්ෂා කෙරේ.

### 4.5. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව භාරකරු ලෙස කටයුතු කරන, ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල 2023 වසරේ දී ආර්ථිකයේ පැවැති අවිනිශ්චිතතා සහ දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනෙහි බලපෑම ඇතුළු අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද, ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදි. සේවක අර්ථසාධක අරමුදල මගින් ප්‍රතිලාභ ගෙවීම, සාමාජික සේවා සැපයීම සහ අනෙකුත් සේවාවන් සැපයීම සඳහා පහසුකම් සැලසීම සාර්ථකව සිදු කරන ලදි.

තවද, සේවක අර්ථසාධක අරමුදල සිය පාර්ශ්වකරුවන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කැපවී සිටියි. තත්කාලීන ලේඛන පරිලෝකනය (real-time document scanning) සහිත බොහෝදුරට කඩදාසි රහිත මෙහෙයුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හරහා සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට නියමිතය. තවද, බහුවිධ ගෙවීම් මාර්ග සපයා දීම මගින් ඉලෙක්ට්‍රොනිකව සාමාජික මුදල් එකතු කිරීමේ ක්‍රියා පටිපාටිය ශක්තිමත් කිරීමට ගෙන ඇති මුලපිරීම්, සේවා යෝජකයන්ට වඩාත් නම්‍යශීලී බවක් ලබා දෙනු ඇත. තවද, පවතින ක්‍රියාවලිය නැවත මෙහෙයවීමේ සහ නවීකරණය කිරීමේ අදහසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් විස්තීර්ණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ඇත. සේවක අර්ථසාධක අරමුදල, සමස්ත අරමුදලේ ආරක්ෂාව සහතික කරන අතරම ඉහළ අවදානම්-ගැළපුම් ප්‍රතිලාභ අනුපාතයක් ලබාගැනීම සඳහා එහි ආයෝජන විවිධාංගීකරණය කිරීමේ මාර්ග සොයමින් සිටියි.

## 5. සමාප්ති සටහන්

නිදහස ලැබීමෙන් පසු ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට ලක් වූ ශ්‍රී ලංකාව නැවත යථා තත්ත්වයට පත්වීමේ මාවතකට පිවිස ඇත. 2022 සහ 2023 වසරවල රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, කඩිනම් සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් ළඟා කරගැනීම සඳහා හේතු විය. ආර්ථිකය පිළිබඳ විශ්වාසය නැවත ඇතිකිරීම, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම පිළිබඳ වැඩපිළිවෙල සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ණය ප්‍රශස්තකරණ වැඩසටහනෙහි ප්‍රගතිය ඉදිරි කාලය තුළ සාර්ව ආර්ථික ස්ථාවරත්වය අඛණ්ඩව ශක්තිමත් කිරීමට සහ ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත. මූර්ත ආර්ථිකය කෙටි කාලීනව, ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කිරීමටත් එම වර්ධනය මැදි කාලීනව තවදුරටත් ඉහළ යනු ඇති බවත් අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම මිල ස්ථායීතාව ඇතුළු ශක්තිමත් සාර්ව ආර්ථික ස්ථායීතාව, රාජ්‍ය ණය තිරසාරභාවය, විදේශ අංශයේ ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම, විශේෂයෙන් ම දූෂණ වංචාවලට අදාළව පවතින අවදානම් සහ අකාර්යක්ෂමතා දුරලීම සඳහා රජය විසින් ක්‍රියාවට නංවමින් පවතින ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග මගින් මෙම ආර්ථික වර්ධනය සඳහා සහාය සැපයෙනු ඇත.

ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්කිරීමේ මෙම ගමන් මාර්ගයේ දී සැලකිය යුතු අභියෝග කිහිපයක් මතුවිය හැකිය. බදු ඉහළ දැමීම සහ බදු පරිපාලනය වැඩිදියුණු කිරීම හරහා රාජ්‍ය ආදායම වැඩි දියුණු කිරීමට ප්‍රයත්න දැරීම අත්‍යවශ්‍ය වුවද, එමගින් විශේෂයෙන් 2024 වසර තුළදී මිල ගණන් ඉහළ යැමේ තත්ත්වයක් උද්ගත විය හැකිය. කෙසේ වෙතත්, විශේෂයෙන්ම ජනගහනයෙන් වැඩි පිරිසකගේ ක්‍රය ශක්තිය හීන වීම මධ්‍යයේ එවැනි උද්ධමනකාරී බලපෑම් කෙටිකාලීන වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අතර, ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සහතික කිරීමට අඛණ්ඩව කැපවීම පූර්ව අවශ්‍යතාවයක් වී ඇති අතර, විදේශ අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ණය නොවන විදේශ ලැබීම් ආකර්ෂණය කර ගැනීමේ උත්සාහයන් බෙහෙවින් වැදගත්

වේ. ආර්ථික වර්ධන මාවතේදී ආර්ථික අර්බුදයෙන් පැන නගින ඇතැම් අනිසි බලපෑම් රටේ වර්ධන අපේක්ෂා කෙරෙහි යම් අයහපත් බලපෑම් ඇති කළ හැකිය. එබැවින්, සාර්ව ආර්ථික පරිසරය පමණක් නොව සමාජ-ආර්ථික තත්ත්වයන් ද තිරසාර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා, අහිතකර ව්‍යාපාර පරිසරය වැනි ආර්ථිකයේ දිගුකාලීන ව්‍යුහාත්මක බාධා විසඳීම සඳහා අඛණ්ඩ කැපවීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලෝකයේ සෙසු රටවල් සමඟ බෙහෙවින් සම්බන්ධ වී ඇති හෙයින් රටේ ප්‍රතිසංස්කරණය උදෙසා ගනු ලබන පියවර ඇතුළු ජාත්‍යන්තර වර්ධනයන් සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත. පවතින අස්ථාවර භූ-දේශපාලන පරිසරය තුළ, ගෝලීය වශයෙන් පැන නගින අවදානම් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. තවද, දේශීය වශයෙන්, ඉදිරියේ දී පැවැත්වීමට අපේක්ෂිත මැතිවරණ හේතුවෙන්, පාර්ශවකරුවන් තීරණ ගැනීමේදී යම් අවිනිශ්චිතතා ඇති විය හැකි අතර, එය ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ ක්‍රියාවලියට යම් ප්‍රමාණයකට බලපෑම් ඇති කළ හැකිය. එපමනක් නොව, කාලගුණික විෂමතා ද ගෝලීය වශයෙන් මුහුණ පා සිටින අහිතකර දේශගුණය ආශ්‍රිත අවදානම් සමග ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධා කළ හැකිය. මේ අතර, කුටුම්භ හා ආයතනික අංශවල ශේෂ පත්‍ර තවදුරටත් පිරිහුනහොත්, එය කුටුම්භ හා ආයතනික ණය ආපසු ගෙවීමේ හැකියාවට බාධාවක් විය හැකි අතර, එමගින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට අවදානමක් කරනු ඇත.

මෙම පරිසරය තුළ, ප්‍රතිසංස්කරණ කටයුතුවලට සහාය දැක්වීමට ජනතාවගේ කැපවීම ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්කිරීමට සහ මැදි කාලීනව ඉහළ, තිරසාර සහ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් ලබා දීමට ඇති හැකියාව සඳහා ඉතා වැදගත් වේ. ප්‍රතිසංස්කරණ කටයුතු වලින් නියමිත කාලයට පෙර ඉවත් වීම විශ්වාසයට හානි කරන අතර, ආර්ථිකයේ වර්ධන අපේක්ෂා කෙරෙහි සැලකිය යුතු අවදානමක් සහ මහජන සුබසාධනය කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරයි. එසේ සිදුවුවහොත්, එය විශේෂයෙන් ම ගැඹුරු ආර්ථික අගාධයකින් ශ්‍රී ලංකාව ඉතා මෑතකදී යථා තත්ත්වයට පත් වූ තත්ත්වයක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට ආපසු හැරවිය නොහැකි හානියක් ඇති කළ හැකිය.

මෙවැනි පසුබිමක් තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව මිල ස්ථායීතාව පවත්වා ගැනීමටත්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමටත් උත්සාහ කරන අතර, ආර්ථිකයට එහි විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට සහාය වනු ඇත. ආර්ථික සහ වෙළඳපොළ වර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර ඕනෑම උද්ධමන පීඩන තත්ත්වයකට සහ මූල්‍ය පද්ධතිය මත ඇති වන අනවශ්‍ය ආතතීන්ට විසඳුම් සෙවීමට කාලෝචිත සහ ක්‍රියාශීලී පියවර ගැනීමට මහ බැංකුව නිරතුරුව සූදානම්ව සිටී. මැදි කාලීනව උද්ධමනය ඉලක්කය තුළ පවතින බව සහතික කිරීමට ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්වයන් ඵලදායි ලෙස කළමනාකරණය කරන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පොලී අනුපාත නිසි මට්ටමේ පවත්වා ගනිමින් මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරන රාමුව යටතේ සිය විධාන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. මෙය මිල ස්ථායීතාව, මූල්‍ය ස්ථාවරත්වය සහ සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සමාජ-ආර්ථික තත්ත්ව නිර්මාණය කිරීමට දායක වනු ඇති අතර, එමඟින් ඵලදායී ආයෝජන සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනය මඟින් මහජන සුබසාධනය සඳහා මග පාදනු ඇත.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය වර්තමාන සහ අපේක්ෂිත ආර්ථික තත්ත්වයන් මත පදනම් වේ. ආර්ථික ඉදිරි දැක්ම සැලකිය යුතු ලෙස වෙනස් කිරීමට බලපෑ හැකි පවතින ආර්ථික තත්ත්වයන්හි අනපේක්ෂිත ප්‍රවණතා හේතුවෙන් දැනට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ප්‍රතිපත්ති සුදුසු පරිදි වෙනස් කිරීමට සිදු විය හැකිය.